සියලු හිමිකම් ඇවිරිණි/ முழுப் பதிப்புரிமையுடையது / All Rights reserved

මධ්‍යම පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மத்திய மாகாண கல்வித் திணைக்களம்
Department of Education Central Province

**08 ශ්‍රේණිය** වර්ෂ අවසාන පරීක්ෂණය - 2019 **15 S**

**ඉස්ලාම්** **කාලය පැය දෙකයි**

**නම හා විභාග අංකයෘ-**..........................................................................................................

**උපදෙස් ෘ-**
- සියළුම ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.
- නිවැරදි පිළිතුර යටින් ඉරක් අඳින්න

I කොටස

01. අල්ලාහ්ගේ අලංකාර නාම වලින් "අත්තවුවාබ්" යනු,
 i. ඉතා පාරිශුද්ධවන්තයා ii. අතිශය ක්ෂමා කරන්නා
 ii. අපරිමිත කරුණාවන්තයා iv. දයාවන්තයා

02. උපතින් අන්ධ වූ අය සුවපත් කිරීමේ බලයක් ලද නබිවරයා,
 i. දාවුද් (අලෛ) ii. සුලෛමාන් (අලෛ) iii. මූසා (අලෛ) iv. ඊසා (අලෛ)

03. "යතීම්" යන අරාබි පදයේ තේරුම,
 i. උපකාරය ii. වැන්දඹුව iii. අනාථයා iv. ආදරය

04. "අල් මාඌන්" හි අර්ථය,
 i. ජලය ii. අල්ප වස්තූන් iii. දුගියා iv. කුලිය ගෙවනු ලබන දිනය

05. හදීස් කලාවේ "ඉස්නාද්" යන පදයෙන් හඟවන්නේ කුමක්ද?
 i. හදීස් ග්‍රන්ථයකි ii. හදීස් දැනුම්දෙන්නා
 iii. හදීස් දැනුම් දෙන්නන්ගේ අනුපිළිවෙල iv. හදීස් ක්ෂේත්‍රයේ විද්වතුන්

06. "මිරාජ්" සිදු වූ මාසය,
 i. රජබ් ii. ෂඃබාන් iii. රමලාන් iv. ෂව්වාල්

07. "නාමූසුල් ඇලම්" යනුවෙන් හඳුන්වනු ලැබුවේ කවුරුන්ද?
 i. නබි ඊසා (අලෛ) ii. ජිබ්රීල් (අලෛ) iii. ඉස්රාෆීල් (අලෛ) iv. මුහම්මද් (අලෛ)

08. මස්ජිදුල් අක්සා පිහිටා ඇත්තේ,
 i. මක්කාවේ ii. මදීනාවේ iii. ජෙරුසලමේ iv. තායිෆ්

09. නබි (සල්) තුමා කොපමණ වසරක් ඉස්ලාමය රහසිගතව ප්‍රචාරය කළේද?
 i. 2 ii. 3 iii. 4 iv. 5

10. මුස්ලිම්වරුන්ට ආරක්ෂාව ලබා දුන් නජ්ජාෂි රජු පාලනය කළ ප්‍රදේශය,
 i. රෝමය ii. පර්සියාව iii. ජෙරුසලම iv. හබෂා

11. හුදෛබියා ගිවිසුම ඇති වූ වර්ෂය,
 i. හිජ්රි 6 ii. හිජ්රි 8 iii. හිජ්රි 10 iv. හිජ්රි 11

12. නබි (සල්) තුමාගේ දෙවන බිරිඳ කවුද?
 i. ආයිෂා (රලි) ii. සෆීය්යා (රලි) iii. සවුදා (රලි) iv. සෛනබ් (රලි)

13. තෆ්සීර් කලාවේ "සෙයිදුල් මුෆස්සිරීන්" යනුවෙන් හඳුන්වනු ලැබූ නබි මිතුරා,
 i. අබ්දුල්ලා ඉබ්නු සුබෛර් (රලි) ii. අබ්දුල්ලා ඉබ්නු අබ්බාස් (රලි)
 iii. අබ්දුල්ලා ඉබ්නු උමර් (රලි) iv. අබ්දුල්ලා ඉබ්නු මස්ඌද් (රලි)

14. හිජ්රතයට පසු මුහාජිරීන්වරුන්ට ලැබුණු පළමු දරුවා,
 i. අබ්දුල්ලා ඉබ්නු සුබෛර් (රලි) ii. අස්මා බින්ත් අබුබක්කර් (රලි)
 iii. සුබෛර් ඉබ්නු අවුවාම් (රලි) iv. අබ්දුල්ලා ඉබ්නු උමර් (රලි)

15. නබි ඉබ්රාහීම් (අලෛ) බිරිඳ සාරා සමඟ හිජ්රත් කළ ප්‍රදේශය,
 i. ඉරාකය ii. ඊජිප්තුව iii. පලස්තීනය iv. මක්කාව

16. භූමිය සශ්‍රීක කිරීම අරාබියෙන් කෙසේ හඳුන්වනු ලබන්නේද?
 i. ඉබාදත් ii. ඉරාදත් iii. ඉමාරත් iv. ෆිර්

17. රුමා නැමති යුදෙව්වාගේ ළිඳ මිලට ගෙන එය පොදු දේපලක් වශයෙන් වක්ෆ් කළ සහාබිවරයා,
i. අබූබක්කර් (රලි) ii. උමර් (රලි) iii. උස්මාන් (රලි) iv. තල්හා (රලි)

18. අල්කුර්ආනයේ සලාතය සමඟ එකට බැඳ අවධාරණය කරන වගකීම,
i. සකාත් ii. උපවාසය iii. හජ් iv. zසකාතුල් ෆිත්ර්

19. "දුආ" යන පදයේ අර්ථය නොවන්නේ,
i. කැඳවීම ii. අයැදීම iii. ඉල්ලීම iv. සමාව දීම

20. "ඉක්ලාස්" යනු,
i. අදහස ii. උදවු පැතීම iii. කැප කිරීම iv. පවිත්‍ර චේතනාව

- පහත සඳහන් පද වලින් නිවැරදි පිළිතුර තෝරා හිස්තැන් පුරවන්න.
**( හුදෛබියා, අකබා, මූසා (අලෛ), ඉබ්රාහීම් (අලෛ), හිල්ෆුල් ෆුලූල්, යත්රිබ්, ඉස්මාඊල් (අලෛ) )**

21. නබි (සල්) තුමාගේ කුඩා වියේ දී ඔහු .................................... නැමති සමාජ සුභසාධනයේ කොටස් කරුවෙකු වුහ.

22. .................................... තුමා සහීහුල්ලා යන විශේෂ නාමයෙන් අමතන ලදී.

23. නබි (සල්) තුමා සහ මදීනා වැසියන් අතර ........................................ ගිවිසුම ඇති විය.

24. මදීනාවේ පැරණි නම .................................. වේ.

25. ආගමක් සහ සුහුෆ් ලද නබිවරයා ........................................... ය.

- **පහත සඳහන් දේ හරි නම් (✓) ලකුණද , වැරදි නම් (X) ලකුණද වරහන තුළ යොදන්න.**

26. ගමන් බිමන් යාම ඉබාදතයකි ( )

27. සිකුරාදා දිනයන්හි සූරා යාසීන් පාරායණය කිරීම නබි තුමා සිදු කළ දෙයකි ( )

28. සූරා මාඌන් හි ආයත් අටකි ( )

29. හදීස් කුද්සි සියල්ල සම්පූර්ණයෙන් විශ්වාස කළ හැකි ගණයට අයත්ය ( )

30. මහ්රම් යනු, විවාහ වීමට අනුමත නොකළ යන්නයි ( )

## II කොටස

- **පහත සඳහන් ප්‍රශ්න අතුරින් ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.**

01. i. සකාත් යනු කුමක්ද?
ii. සකාත් සහ සදකා අතර වෙනස්කම් හතරක් ලියන්න.
iii. රමලානයේ පිළිපැදිය යුතු යැයි ඉස්ලාම් අවධාරණය කරන යහපත් ක්‍රියා හයක් ලියන්න.

02. i. දිගුකාලීනව පවු කිරීම නිසා අල්ලාහ් විසින් විනාශ කර දැමූ සමූහයන් දෙකකගේ නම් ලියන්න.
ii. අල්ලාහ්ගෙන් ප්‍රාර්ථනා කිරීම සඳහා වඩාත් සුදුසු අවස්ථා හතරක් ලියන්න.
iii. ප්‍රාර්ථනා කිරීමේදී පිළිපැදිය යුතු ආචාරධර්ම හයක් ලියන්න.

03. i. වහී හි වර්ග දෙක කුමක්ද?
ii. "සුනනු අර්බආ" යනුවෙන් අමතනු ලබන හදීස් ග්‍රන්ථ මොනවාදැයි ලියන්න.
iii. මව්ලූආත් හදීස් බිහිවීමට බලපෑ කාරණා හයක් ලියන්න.

04. i. නබි ඉබ්රාහීම් (අලෛ) තුමාගේ විශේෂ නම් දෙකක් ලියන්න.
ii. "අල් ඉස්රා" , "අල් මිඃරාජ්" යන පද දෙක පැහැදිලි කරන්න.
iii. නබිවරුන් තුළ දැකිය හැකි වූ ශ්‍රේෂ්ඨ ගුණාංග මොනවාද?

05. i. සමාජ සේවය යන්නෙන් ඔබ අවබෝධ කරගන්නේ කුමක්ද?
ii. සමාජ සේවයන් හතරක් ලියන්න.
iii. නබි (සල්) තුමා විසින් ඉටු කරන ලද සමාජ සේවයන් හතරක් ලියන්න.

06. i. "අල්කුර්ආන් අවසාන ආගමයි" යන්නට සාධාරණ හේතු දක්වන්න.
ii. "උලුල් අස්ම්" යනුවෙන් හඳුන්වන නබිවරුන් කවුද?
iii. සලාතය මඟින් ලැබෙන මෙලොව ප්‍රයෝජන හතරක් ලියන්න.

07. i. පහත මාතෘකා අතුරින් මාතෘකා දෙකක් පිළිබඳව කෙටි සටහන් ලියන්න.
i. පොදු දේපල සුරකිමු
ii. අජ්නබි - මහ්රම්
iii. සෆීය්යා (රලි) තුමිය
iv. සූරා අල් මාඌන් හි ඉගැන්වීම්